# 9. සංචාරක

## 9.1 සංචාරක ආකර්ශනීය පාරිසරික ප්‍රදේශ

| | සමාජ වටිනාකමක් උසුලන ස්ථානයේ නම/ ස්ථානය | පිහිටි ග්‍රාම නිලධාරී වසම | වාර්ෂිකව පැමිණෙන සංචාරකයින් ගණන | |
|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය |
| පාරිසරික | කබරගල දියඇල්ල | හාන්දුකන්ද | 408 | - |
| | මනන් ඇල්ල | එ/පහලගම | 2100 | - |
| | පරණගම වැව | දෙහෙරගොඩ | 300 | - |
| | අම්පිටික්නද මූකලාන | මුදුන්කොටුව | 800 | - |
| ආගමික | නැදුන් රජමහා විහාරය | කිරිඇල්ල | 5000 | 700 |
| | මැරේ කැලේ ආරණය සේනාසනය | දෙහෙරගොඩ | 800 | - |
| පෞරාණික / ඓතිහාසික | නැදුන් රජමහා විහාරය | කිරිඇල්ල | 5000 | 700 |
| | එල්ලාවල ගංගාරාම විහාරය | දෙහෙරගොඩ | 800 | - |
| | ඇල්ලගාව තෙද පත්තිනි දේවාලය | ඇල්ලගාව | 50000 | 1000 |
| | අවුකන ගල | හාන්දුකන්ද | 300 | - |

## 9.2 සංචාරක හෝටල් සහ නවාතැන් පහසුකම්

| අනු අංකය | හෝටලයේ නම | හෝටල් වර්ගය | කාමර සංඛ්‍යාව | නවාතැන් ගතහැකි සංඛ්‍යාව | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1 | ඉමගිර හෝටලය මාටුවාගල | උත්සව ශාලා | - | - | 0719207773 |
| 2 | විජය හොලිඩේ රිසෝට් එපිටවල | සංචාරක | 50 | 100 | 045-2265992 |
| 3 | Tappers village එපිටවල | සංචාරක | 30 | 50 | |
| 4 | කිරිඇල්ල රෙස්ට් කිරිඇල්ල | උත්සව ශාලා | 03 | 15 | 045-2265944 |
| 5 | The Ret Reet (ද රෙට් රීට්) ඇල්ලගාව | සංචාරක බංගලා | 04 | 08 | 077-3052199 |
| 6 | Wild Spring (වයිල්ඩ් ස්ප්‍රින්ග්) ඇල්ලගාව | සංචාරක බංගලා | 06 | 12 | 077-7320231 |
| 7 | S.K රෙස්ට්වුරන්ස් යටිපච්ච වසම | සාමාන්‍ය | 10 | 20 | 0777537373 |
| 8 | කොලින් රෙස්ට් දොඩම්පෙ | ලැගුම්හල් හා උත්සව ශාලා | 04 | 08 | 0712756197 |
| 9 | දෙගම්බඩ රිසෝට් | උත්සව ශාලා | | 100 | |

## 9.3 කිරිඇල්ල කොට්ඨාසයේ පැරණි වලව් පිළිබඳ තොරතුරු

| අනු අංකය | ග්‍රා.නි. වසම | වලව්වේ නම | වත්මන් හිමිකරුගේ නම ලිපිනය | වලව්ව පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 1 | 150 දොඩම්පේ | දැල වලව්ව | ගාමිණී දැල බණ්ඩාර, මිල්ලකඩේ දොඩම්පේ | 1975 වර්ෂයේ වත්මන් හිමිකරු විසින් ප්‍රතිසංස්කරණය කර ඇත. |
| 2 | | පොල්හේන වලව්ව | ඒ.සී.එම්. ජයසුන්දර බණ්ඩාර තුන්අදහේන, ගොරකඇල, දොඩම්පේ | 1943 වර්ෂයේ සාදා ඇති අතර, ඒ.එම්. ජයසුන්දර යන අය මුල් අයිතිකරු වේ |
| 3 | | පරණවත්ත වලව්ව | ඕ.එල්.එම්. ජයසුන්දර , ගොරක ඇල, දොඩම්පේ | 1977 වර්ෂයේ පමණ සකසා ඇත. |
| 4 | | පොල්වත්ත වලව්ව | ඩබ්.එල්.බී. දසනායක ගොරකඇල, දොඩම්පේ | දැනට වසර 75කට පමණ පෙර සැදුම් ලද්දකි. |
| 5 | | කන්තෝරු වලව්ව | රූපසිංහ මුදලි බුද්ධික බණ්ඩා රූපසිංහ, 250, දොඩම්පේ, රත්නපුර | වසර 100කට ආසන්න මෙහි නිර්මාතෘ රූපසිංහ මුදලි සෙනෙවිරත්න බණ්ඩාර මහතායි. ඔහු එම ප්‍රදේශයේ මුලාදෑනි වූ අතර මෙහි කාමර 10ක් මැද මිදුලක් හා ආරුක්කු හැඩයේ නිර්මාණවලින් යුක්ත වේ. |
| 6 | 149 බී/අකුරණ | අකුරණ වලව්ව, අංගම්මන වලව්ව | දීප්ති ගැමුණු අංගම්මන බණ්ඩාර, අකුරණ , එල්ලාවල | මෙම වලව්ව සාදා ඇත්තේ එක්නැලිගොඩ බස්නායක නිලමෙතුමා විසිනි. ක්‍රි.ව 1600-1800ත් පළවන රාජසිංහ සමයේ සිට සිට සමන් දේවාලයේ බස්නායක ධූරය කටයුතු ඔහුගේ පරම්පරාව සිදුකොට තිබෙන බව ක්‍රිෂ්ණ බණ්ඩාර ලියන ලද සමන් වෙහෙර සබරගමු සමන් දේවාලය හා ශිරෝපාදය යන ග්‍රන්ථ මගින් මනාව පැහැදිලි වේ. මෙම වලව්ව අවුරුදු 415ක් පමණ පැරණි වේ. ක්‍රි.ව 1236-1271 දඹදෙනි රාජධානි යුගයේ පටන් මෙම ස්ථානයට නුදුරුව වාසස්ථානයක් තිබුණු බවට පුරාවිද්‍යා අවශේෂ කුරහන්ගල් , ගල්වංගෙඩි, ගල් පහන් හමුවීමෙන් පැහැදිලි වේ. ක්‍රි.ව 1800 පසුව මෙම වලව්ව අංගම්මන පරම්පරාවට හිමි වූ පාරම්පරික උරුමයක් ලෙස පවත්වාගෙන යයි. |
| 7 | බටහිර දොඩම්පේ | වනුගිරිය වලව්ව | ජයසිංහ මනම්පේරි මුදලි නන්දතිස්ස පොහොරබාව, ගොරක ඇල ,දොඩම්පේ | 1963 එන්.ටී. පොහොරබාව විසින් සාදා ඇත. කාමර 4ක්, කෑම කාමරයන් හා මැද මිදුලකින් යුක්ත වේ. |

| අනු අංකය | ග්‍රා.නි. වසම | වලව්වේ නම | වත්මන් හිමිකරුගේ නම ලිපිනය | වලව්ව පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 8 | 145 කිරිඇල්ල | | හාන්දුරුකන්ද මුදියන්සේලාගේ සුමනාවතී කුමාරිහාමි, එගොඩ ගෙවත්ත, කිරිඇල්ල | 1939 දෙහෙරගොඩ මුදියන්සේලාගේ ගුණසේකර බණ්ඩා විසින් ඉදිකරන ලදී. කාමර 6කි. සොල්දර කාමර 3කින් යුක්ත වේ. |
| 9 | 145 කිරිඇල්ල | සිරිමැදුර වලව්ව | තනුර කිරිඇල්ල, නැදුන්විහාර පාර, කිරිඇල්ල | 1936 වසරේ ඉදිකර ඇත. කෝණාර රණසිංහ බස්නායක මුදියන්සේ රාලහාමිලාගේ ජේම්ස් බණ්ඩා මහතා විසින් ඉදිකර ඇත. කාමර 5ක් සොල්දර සහිත මැද මිදුලක් ඇත. |
| 10 | 145 කිරිඇල්ල | මාරලිය වලව්ව | ඩී.කේ.බී. මාරඹේ හිඳුරංගල පාර, කිරිඇල්ල | 1900 පමණ කාලයේ ඉදිකර ඇත. දැනට හිමිකරුගේ මුල් පරම්පරාවේ අය විසින් ඉදිකර ඇත. කාමර 6කි. සාල 2ක් මැද මිදුල සහිත වේ. |
| 11 | එපිටවල | (ශ්‍රී සුදර්ශන වලව්ව) දිග්ගලහේන වලව්ව | දිග්ගලහේන , එපිටවල, කිරිඇල්ල | මෙම වලව්ව දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි. රටේ මහතුන් කෝරළේ මහතුන් මෙහි පාලකයන් වී සිට ඇත. අතීතයේ සුවිශාල නින්දගමකට උරුමය තිබීඇතත් අද ඇත්තේ වලව්වේ හතරමායිම පමණි. ඉතිරි සියල්ල ක්‍රමයෙන් විකුණා ඇත. වලව්වේ ගොඩනැගිල්ලේ කොටසක් විනාශ වී ඇත. වර්ථමාන හිමිකරු තිබෙන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරමින් පවතී. |
| 12 | 145 ඩී හාන්දුකන් ද | උඩහවලව්ව | මෛත්‍රී සුබසාධන පදනම කොඩිතුවක්කු කන්ද, කිරිඇල්ල | අවුරුදු 100ක් පැරණි වේ. මහල් දෙකකින් යුක්ත වේ. පඩිපෙල ලීයෙන් තනා ඇත. වර්තමානයෙහි මෙහි වැඩිහිටි නිවාසය හා මෙහෙණි ආරණ්‍යක් පවත්වාගෙන යයි. |
| 13 | 145/බී , ඉඩංගොඩ | ලෙනාඩි කිරිඇල්ල අලුත් වලව්ව | ජී. ජාලිය බණ්ඩාර, අලුත් වලව්ව, ඉඩංගොඩ, කිරිඇල්ල | ගනේමුල්ල කෝරාලලාගේ ජයසිංහ යන අයගෙන් පැවත එන මෙම වලව්ව 1890 වර්ෂයේ ඉදිකර ඇත. මෙම වලව්වේ කාමර 5ක් සේවක කාමර 2ක්, ආලින්ද 2ක් මුළුතැන්ගෙය හා මැද මිදුලකින් සමන්විතය. පැරණි ලී කැටයම් සහිත ගෘහභාණ්ඩ දක්කට ඇත. |
| 14 | 145/බී , ඉඩංගොඩ | කොස්හේන වලව්ව | එච්.එම්. ලිලාන් සමරවික්‍රම ධනවර්ධන කොස්හේන , ඉඩංගොඩ කිරිඇල්ල | වර්ථමානයේ මෙම වලව්වේ ස්වරූපය වෙනස් කර නව නිවසක් ලෙස ඉදිකර ඇත. මෙම වලව්ව අවුරුදු 100ක් පමණ පැරණි වන අතර වර්තමානයේ ජීවත්වන්නන් මෙම වලව්වේ ආකෘතිය වෙනස් කර ඇත. |

| අනු අංකය | ග්‍රා.නි. වසම | වලව්වේ නම | වත්මන් හිමිකරුගේ නම ලිපිනය | වලව්ව පිලිබඳ විස්තර |
|---|---|---|---|---|
| 15 | 147 එල්ලාවල | දෙහෙරගොඩ අලුත්වලව්ව | ඊ.ආර්.කේ.ඩී එම්.ආර්. නිරංජන් දෙහෙරගොඩ, අලුත් වලව්ව එල්ලාවල | මෙම වලව්ව ඉදිකර වර්ෂ 85ක් පමණ වේ. |
| 16 | 147/බී දෙහෙර ගොඩ | වෙලේ වලව්ව | වෛරාවන දෙහෙරගොඩ මහතා පරණගම, එල්ලාවල | 1800 ගණන්වල ගොඩනගන ලද වලව්ව පසුව වෙනස් කර ඇත. දුර්ලභ ශාක වර්ග රාශියක් වලව් භූමියේ දක්නට ඇත. සපරගමු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත ඉවාන් ටමේබර්ල්ඩ් ඩියරන්ඩ් බර්ඩ Evan Marberiy Dyrand Bude විසින් 1891.12.06 වැනි දින මෙම වලව්වේ ප්‍රධානී දෙහෙරගොඩ මුදියන්සේලාගේ ලොකු බණ්ඩා කුරුවිට කෝරලේ උඩපත්තුවේ කෝරාල කෙනෙකු ලෙස ද 1898.02.16 වන දින සමාදාන මුලාදෑණියකු ලෙස ද එම අය පත් කර ඇත. වෛරාවන දෙහෙරගොඩ මහතා එම ලොකු බණ්ඩාර මහතාගේ මුනුබුරා ය. |
| 17 | 147/බී දෙහෙර ගොඩ | තැඹිලි වලව්ව | ඩබ්.ඩී. වික්‍රමසිංහ, දෙහෙරගොඩ, එල්ලාවල | මෙහි රොබට් බණ්ඩා දෙහෙරගොඩ ද හිටපු කෝරාල කෙනෙකි. 1800 ගණන්වල ඉදිකරන ලද්දකි. රොබට් බණ්ඩා දෙහෙරගොඩට පුතුන් තිදෙනෙකු හා දියණියක් සිටි බවත් කියවේ. පසු කාලීනව මෙම වලව්ව විකුණා දමා ඇත. අද එහි හිමිකරු රදල පැලැන්තියේ නොවේ. වලව්ව වටේ අඩි කීපයක් කබොක් ගලින් නිර්මිත පවුරක් හා කුඩා අගලක් වේ. |
| 18 | 147/බී දෙහෙර ගොඩ | දෙහෙරගොඩ වලව්ව | එස්.පී දෙහෙරගොඩ, එල්ලාවල , පරණගම | 1800 ගණන්වල ඉදිකරන ලද්දකි. මෙම වලව්වේ නිවැසි රිචඩ් දෙහෙරගොඩ මහතා එල්ලාවල ප්‍රදේශයට අධ්‍යාපනය රැගෙන ආ අය වේ. ඔහු ඉස්කෝලේ නිලමේ ලෙස ද වලව්ව ගුරු ගෙදර ලෙස ද හඳුන්වා ඇත. එල්ලාවල කණිෂ්ඨ විද්‍යාලය ඉදිකිරීමේ දී මූලිකත්වය ගෙන ඇත්තේ මෙතුමා ය. ශාන්ත දෙහෙරගොඩ (වත්මන් හිමිකරු) ඔහුගේ වැඩිමල් පුත්‍රයාගේ පුතාවේ. බාල පුතා රෙජී දෙහෙරගොඩ 1970 මියගොස් ඇත.<br>රිචඩ් දෙහෙරගොඩ මහතාගේ සේවකයකු රදාදෙණිය නම් කුඹුරේ පතලයක් කැපීමට අවසර ඉල්ලා ඇත. අවසර දීමෙන් පසු පතලය කැපීමේදී රතු මැණිකක් හමු වූ පසු සේවකයා සැලවී ඇත. සේවකයා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දොර මුල්ලක සැඟව සිටියදී රිචඞ් මහතා විමසීමේ දී විස්තරය පවසා ඇත. එම මැණික් ගල කොළඹ ව්‍යාපාරිකයකු වූ මාකන් මාකර් මහතාට ලබා දී ඇත. එවකට එංගලන්ත පාලකයා වූ ජෝර්ජ් රජු විසින් ලබා දුන් එය අද එංගලන්ත මහරැජිනගේ ඔටුන්නේ ඇති ප්‍රධාන මාණික්‍ය බව කියවේ. |